# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2123/29 - 2019 මැයි මස 14 වැනි අඟහරුවාදා - 2019.05.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනත**

57 වන වගන්තිය යටතේ නියෝගය

1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 57 වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍ය රවී කරුණානායක වන මම ලංකා විදුලිබල මණ්ඩලයට අවශ්‍ය වී ඇති මෙහි උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම් අත්කර ගැනීමේ යෝජනාව මෙම නියෝගය මඟින් අනුමත කරමි.

රවී කරුණානායක,
විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍ය.

2019 මැයි මස 09 වැනි දින.

*උපලේඛනය*

ශ්‍රී ලංකාද්වීපයේ ඌව පළාතේ, මොණරාගල පරිපාලන දිස්ත්‍රික්කයේ, වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අංක 152A දරන ගල්බොක්ක ග්‍රාමනිලධාරී කොට්ඨාසයේ, දිඹුලාමුරේ ග්‍රාමයේ පිහිටි බලයලත් මිනින්දෝරු එච්. එම්. ඒ. ආර්. බී. හේරත් විසින් පිළියෙල කරන ලද පිඹුරු අංක 870 දරන 2016.10.08 දිනැති සැලැස්මෙහි ලොට් අංක 1 වශයෙන් දැක්වෙන පහත සඳහන් පරිදි මායිම් සහිත ප්‍රමාණයෙන් පර්චස් 15 ක් වූ ඉඩම.

*උතුරට* : පිඹුරු අංක 2062 හි ලොට් අංක 02 හි කොටසක්
*නැගෙනහිරට* : පිඹුරු අංක 2062 හි ලොට් අංක 02 හි කොටසක්
*දකුණට* : පාර (පිඹුරු අංක 2062 හි ලොට් අංක 04)
*බටහිරට* : පාර (RDA).

*හිමිකම් කියන අය* : *එස්. වී. එස්. විජේසිංහ*
*ආර්. ඒ. එස්. විජේසිංහ*

05 - 778

1A - G 30068 — 27 (2019/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*